තලාව ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
--------------------------

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 10 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
-----------------

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම
--------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු බිල්කිරීම් රු.6,248,352 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.6,074,761 ක් ලෙස දක්වා තිබීම නිසා රු.173,591 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේ නව ජල සම්බන්ධතා ආදායම් බිල්කිරීම් රු.608,063 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.749,812 ක් ලෙස දක්වා තිබීම නිසා රු.141,749 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ආදායම් බිල්කිරීම් රු.4,335,441 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.4,535,441 ක් ලෙස දක්වා තිබීම නිසා රු.200,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.14,913,461 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.16,539,796 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,626,335 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික වටිනාකම රු.1,970,971 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (vi) | බැකෝලෝඩරය කුලියට දීම මගින් තවදුරටත් අයකරගත යුතුව තිබූ රු.105,900 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (vii) | 2018 වර්ෂයේ නිකුත් කර තිබුණු ලදුපත් 65 කට අදාළ රු.371,946 ක් සභා අරමුදලට බැර නොකිරීමෙන් සිදු වී තිබුණු මූල්‍යමය අක්‍රමිකතාවය සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව තිබුණු මුදල ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (viii) | මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.73,000,000 ක් වියදම් කර ඉදිකර 2019 ජුනි 27 දින සභාවට පවරා ඇති තඹුත්තේගම බහුකාර්ය ගොඩනැගිල්ල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සභා දේපල නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (ix) | සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු ව්‍යාපෘති 05 කට අදාළ රු.3,758,195 ක වියදම් හඳුනාගෙන ප්‍රාග්ධන ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (x) | සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරන ලද ගොඩනැගිලි 02 ක වටිනාකම රු.2,818,000 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.2,246,205 ක් ලෙස දැක්වීම නිසා ස්ථාවර වත්කම් රු.571,795 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (xi) | මධ්‍යම පරිසර අධිකාරිය සමඟ කරගහවැව කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ඇතිකරගත් ගිවිසුම අනුව සභාව කටයුතු කර නොතිබීම නිසා ගෙවීමට සිදුවී තිබුණු රු.2,984,588 ක් වූ මුදල බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (xii) | ඔරුගලයාය කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (xiii) | සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර තිබුණු ව්‍යාපෘති 36 ක් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.2,771,381 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (xiv) | ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ සිදුකළ ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් තවදුරටත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට තිබුණු රු.1,895,163 වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (xv) | සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘතිවල මුළු වියදම රු.31,271,403 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.25,943,822 ක් ලෙස දක්වා තිබීම නිසා ප්‍රාග්ධන වියදම් රු.5,327,581 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (xvi) | 2018 වර්ෂයේ දෙසැම්බර් මසට අදාළ වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් රු.2,796,937 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (xvii) | 2019 වර්ෂයේ සිදුවී තිබුණු වාහන අනතුරක් සම්බන්ධව ලැබී තිබුණු රු.603,573 ක් වූ රක්ෂණ වන්දි මුදල වරෙන්තු ගාස්තු හා දඩ ආදායම් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |

(ආ) නොසැසඳුණු ගිණුම්

--------------- ------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | --------------- | ------------------------------ |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 06 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.2,107,069 ක් හා ලේඛන අනුව වටිනාකම රු.2,142,890 ක් වූයෙන් රු.368,905 ක එකතු වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට ආදායම් අනුව වෙන් වෙන් වශයෙන් ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ වටිනාකම අතර රු.127,832 ක වෙනසක් පැවතුණි. | ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු රු.1,490,783 ක ලැබියයුතු ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) ඉකුත් වර්ෂ ගණනාවක සිට පැවත එමින් තිබුණු රු.630,774 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයට පෙර මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) වටිනාකම රු. 367,504,800 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |
| (ii) අර්ධ වශයෙන් ඉදිකර තිබු කරගහවැව කසළ අංගනයේ සේවක විවේකාගාරය හා කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධ ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී. | අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කරමි. |
| (iii) මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.9,500,000 ක් වූ තඹුත්තේගම නව සතිපොල ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාල ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතියට අදාළ ටෙන්ඩර් කටයුතු සහ ගෙවීම් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇත. |
| (iv) පොදු තැන්පත් ගිණුමේ පැවති රු.26,685,502 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණු අතර ඒ සම්බන්ධව විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | සභාපති විසින් පත්කල කමිටුවක් මගින් ලබාදුන් නිර්දේශ හා මහා සභාවෙන් ලබාදුන් අනුමැතියට අනුව මෙම වටිනාකම පොත්වලින් ඉවත් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (v) | 2017 වර්ෂයේ පළාත් සභා ව්‍යාපෘතිවලට අදාළව සභිකවරුන් 03 දෙනෙකු විසින් රැගෙන ගොස් තිබුණු රු.1,308,999 ක් වටිනා භාණ්ඩ අයිතම 15817 ක් ප්‍රතිලාභීන් වෙත ලැබී තිබුණු බව සනාථ කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | සභිකවරුන් 03 දෙනෙකු විසින් ගබඩාවෙන් රැගෙන ගොස් තිබු රු.1,308,909 ක් වටිනා භාණ්ඩ අයිතම 15817 අදාල ප්‍රතිලාභීන් වෙත ලබාදුන් බවට සනාථ කිරීමේ ලියවිලි ඇතුලත් ලිපිගොනු සොයා ගැනීමට නොහැකිවීමෙන් අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 203 අධිකාරිය | - | සභාව සතු TAFE වර්ගයේ ට්‍රැක්ටර් රථයක් ලියාපදිංචි කර නොතිබුණි | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | මු.රෙ 571 | 207,029 | සභාව සතු වසර 02 ඉක්ම වූ තැන්පතු 16 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදන | | | | |
| | (i) 2008 පෙබරවාරි 01 දිනැති 1534/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය (ඇ) උපලේඛනය | 288,000 | 2019 වර්ෂයේ බලපත්‍ර ලබාගෙන නොතිබුණු කර්මාන්ත 72 ක් හඳුනාගෙන තිබුණු අතර සභාවට අහිමි වී තිබූ ආදායම රු.288,000 ක් ඉක්මවා තිබුණි. | පරිසර බලපත්‍ර සමීක්ෂණය සිදුකර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ii) | උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයා ගේ 2018 අගෝස්තු 29 දිනැති 2086/15 ගැසට් නිවේදනය 5 ඡේදය | 53,000 | | 2018 ජූලි 01 දින සිට සභිකයන් පැමිණෙන එක් රැස්වීමක් සඳහා රු.500 බැගින් දීමනා ගෙවිය යුතු වුවද සභාව විසින් 2018 අප්‍රේල් සිට දීමනා ගෙවා තිබීම නිසා සභිකයින් 37 දෙනෙකුට වැඩිපුර ගෙවූ දීමනා එකතුව රු.53,000 ක් විය. | අනුමැතියකින් තොරවූ ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාර්ගෝපදේශ සංග්‍රහය 2.9.1 ඡේදය | 174,200 | i. | එක් ප්‍රසම්පාදන කමිටුවකදී ලබාගන්නා තීරණ ප්‍රමාණය දීමනා ගෙවීම සඳහා එක් කමිටුවක් ලෙස සැලකිය යුතු වුවත් 2018 දෙසැම්බර් 20 හා 2019 දෙසැම්බර් 31 දිනවල කමිටු 02 ක් මගින් සිදු කර තිබුණු ප්‍රසම්පාදන තීරණ සංඛ්‍යාව පදනම්ව දීමනා ගෙවීම නිසා 2018 සහ 2019 වර්ෂවල රු.174,200 ක අධි ගෙවීමක් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව දීමනා ගෙවීමට හා අධි ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එක් ප්‍රසම්පාදන කමිටුවකදී තීරණ ප්‍රමාණය වෙන වෙනම සාකච්ඡා කර ලංසුකරුවන් පිළිබඳ තීරණ වලට එළඹීමෙන් පසු එක් එක් තීරණයක් සඳහා කමිටු වාර්තාවක් ලියන බැවින් එම තීරණ සංඛ්‍යාව පදනම් කරගෙන ප්‍රසම්පාදන දීමනා ලබාගෙන ඇත. |
| | | 910,832 | ii. | ගොඩනැගිලි අයදුම්පත් නිර්දේශ කිරීම, විථි රේඛා සහතික හා නොපවරා ගැනීමේ සහතික නිර්දේශ කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම පිණිස ක්ෂේත්‍ර පරීක්ෂණවලට අයකල යුතු පරීක්ෂණ ගාස්තුව සභා තීරණයකින් තොරව අයකර ගෙන තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අයකළ යුතු පරීක්ෂණ ගාස්තු සභාව මගින් තීරණය කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ | - | | දෛනික පැමිණීම හා පිටවීම සටහන් කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළ | චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර | පිළිගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 චක්‍රලේඛය | සේවකයන් 24 දෙනකු විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | භාවිතය සඳහා කටයුතු කළ යුතුවේ. | |
| (ඊ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 10 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,570,537 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,224,306 ක් විය.

2.2 මූල්‍ය පාලනය
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කරගහවැව කසළ අංගනය ඉදිකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදී තිබු රු.3,446,848 ක මුදලින් රු.1,121,026 ක් ව්‍යාපෘතිය සඳහා වැය කර ඉතිරි මුදල් රු. 2,325,822 ක් සභාවේ කටයුතු සඳහා වැය කර තිබුණි. | බාහිරින් ලැබෙන මුදල් අදාළ අරමුණු සඳහාම යෙදිය යුතුවේ. | ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාදුන් රු.3,446,848 ක මුදලින් රු.2,609,601 ක් ඉදිකිරීම සඳහා වියදම් කර ඇතත් සම්පූර්ණ විස්තර සහිත ලිඛිත සාක්ෂි නොමැත. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,388,929 | 14,136,456 | 13,640,296 | 16,011,924 | 13,186,113 | 13,697,894 | 14,871,741 | 15,515,764 |
| (ii) | කුලී | 18,306,305 | 12,275,059 | 12,174,008 | 853,619 | 22,669,866 | 12,322,425 | 12,636,255 | 752,568 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,963,000 | 5,460,218 | 5,460,218 | - | 2,678,000 | 4,149,953 | 4,149,953 | - |
| (iv) | වරෙන්තු ගාස්තු හා උසාවි දඩ | 6,967,000 | 14,324,423 | 10,396,339 | 16,539,796 | 6,930,000 | 12,319,650 | 9,500,000 | 12,611,712 |
| | එකතුව | 44,625,234 | 46,196,156 | 41,670,861 | 33,405,339 | 45,463,979 | 42,489,922 | 41,157,949 | 28,880,044 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල ව්‍යාපෘති 04 කට අදාළව හිඟ ජලබදු ආදායම රු.1,431,280 ක් වූ අතර එය වර්ෂයේ බිල්කළ ආදායමින් සියයට 64 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 3408 කින් 2009 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන බදු අයකර තිබුණි. | නව තක්සේරුවක් මත වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නව වරිපනම් තක්සේරුවක් සිදුකර ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි මේ වනවිට තොරතුරු සකස් කරගෙන යන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 වර්ෂයෙන් පසු වරිපනම් බලප්‍රදේශයේ නව ඉදිකිරීම් හා වෙනස්කිරීම් සම්බන්ධව තාවකාලික තක්සේරු ලබාගැනීමට සහ එම ස්ථානවලින් වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුවක් සිදුකර වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තාවකාලික තක්සේරු ලබාගෙන ඇති බැවින් එය මහා සභා තීරණ සමහ පළාත් පාලන දෙපාර්තමේන්තුව මහින් විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරියේදී යොමු කරමි. |

2.3.4 කුලී
----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර 18 කින් අයවිය යුතුව පැවති හිඟ කඩ කුලී රු.267,120 ක් විය. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකරගත යුතු මුදල සම්බන්ධව ඉදිරියේදී සභාවට යොමු කර එයට එරෙහිව කටයුතු කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වෙළඳ අයිතිය බදුදී තිබුණු අවස්ථා 15 කින් ලැබිය යුතුව තිබුණු හිඟ මුදල රු.359,964 ක් විය. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයට පෙර බදුදී ඇති වෙළඳ අයිතමයක් වේ. ඊට අදාල නීතිමය ලියවිලි නොමැති බැවින් තහවුරු කර ගැනීමට හැකියාවක් නොමැත. |

2.3.5 බලපත්‍ර ගාස්තු
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු 84 කින් සහ තඹුත්තේගම කාර්යාල බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු 97 කින් අයවිය යුතු මුළු මුදල රු.1,491,175 ක් විය. | අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.14,913,461 ක් හා මුද්දර ගාස්තු රු.17,231,141 ක් විය. | අදාල නිලධාරීන්ගෙන් ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාල කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් සඳහා අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම (Out Put) ලබානොගැනීම

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යන් 03 ක් ඉටුකිරීම සඳහා රු.1,121,027 ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (Out Put) අත්පත් කරගෙන නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර එම ව්‍යාපෘති ඵලදායී ලෙස සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රයෝජනයට ගතහැකි පරිදි සකස් කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් ව්‍යාපෘතිය අවසන් කර නැත. |

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i. | විශේෂිත පළාත් පාලන ව්‍යාපෘති යටතේ තඹුත්තේගම මධ්‍ය මහා විද්‍යාලයේ ජලනල පද්ධතිය සකස් කිරීමට රු.3,500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | අනුමත කරන ලද ව්‍යපෘති එම වර්ෂය තුළදීම ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ටෙන්ඩර් කළයුතු බැවින් කාලය ප්‍රමාණවත් නොවීම නිසා ඉටුකරගත නොහැකි වී ඇත. |
| ii. | විශේෂ අවශ්‍යතා ඇති ගම්මාන සංවර්ධන වැඩ සටහන යටතේ පලුගස්වැව පියදාස මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය හා නල්ලමුදාව ගමේ අතුරු මාර්ගය කුට්ටිගල් අතුරා ප්‍රතිසංස්කරණයට රු.500,000 බැගින් රු.1,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අදාළ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉටුකර නොතිබුණි. | අනුමත කරන ලද ව්‍යපෘති එම වර්ෂය තුලම ඵලදායි ලෙස ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය සඳහා 2019 දෙසැම්බර් 10 දින ගිවිසුම්ගත වී ඇති අතර අදාල කාලය තුල ව්‍යාපෘති වැඩ කොටස් ඉටුනොකිරීම මත ව්‍යාපෘතිය අවලංගු කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වු 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යායපත්‍රය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු ප්‍රමුඛ කොට ගෙන තලාව බල ප්‍රදේශයේ සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පළාත් භාණ්ඩාගාරය මගින් උසාවි දඩ මුදල් ප්‍රේෂණය කිරීමේදී සභාව විසින් 2018 වර්ෂයේ යෝජනා කර තිබුණු ව්‍යාපෘති 02 ක් 2019 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර නොතිබුණු අතර ඒ සඳහා ලැබී තිබුණු රු.7,420,864 ක් අංක 315-1001-10000041 දරන මහජන බැංකු කර්මාන්ත ජංගම ගිණුමේ නිශ්කාර්යව රඳවා ගෙන තිබුණි. | යෝජනා කර ඇති ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කර මහජන අයිතියට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. | සභා ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු පළාත් පාලන ආයතනයේ සිදුකරන අතර එය අවසන් වී ඇත. |
| (ආ) වටිනාකම රු.7,590,000 ක්වූ වාහන 02 කට සමාලෝචිත වර්ෂයේ අනතුරුවලින් සිදු වී තිබුණු රු.4,334,020 ක් වූ මුල්‍යමය අලාභයන් සම්බන්ධව මුදල් රෙගුලාසි 103,104 සහ 105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | i. PF -7345 කැබ්රථය අලාභය රු.3,400,520 කි. වගකිවයුතු පාර්ශව තවමත් හඳුනාගෙන නැත.<br>ii. LL -6932 ටිපර් රථයේ අලාභය රු.932,500 කි. ඉන් 80% ක් රක්ෂණ සමාගමෙන් ලැබී ඇත. |

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තලාව කරගහවැව කසළ මධ්‍යස්ථානයේ ඉදිකිරීමේ උප ව්‍යාපෘති 03 කට අදාළව අයකල යුතු ප්‍රමාද ගාස්තු රු. 235,440 ක් අයනොකර අදාළ කොන්ත්‍රාත් කරුවන්ට ගෙවීම් කර තිබුණි. | ගිවිසුම් අනුව අයකළයුතු ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. | ප්‍රමාද ගාස්තු අයකරගෙන නොමැති බව තහවුරු වේ. |
| (ආ) කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවසන් නොකිරීම මත දෛනිකව එකතුවන කසළ තඹුත්තේගම ඕරුගලයාය කසළ මධ්‍යස්ථානයට ප්‍රවාහනය කිරීම සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් නිමකිරීමට කටයුතු කළයුතු වේ. | තලාව නගරය කසළ එකතු කිරීම සඳහා එක් ට්‍රැක්ටරයක් භාවිතා වන බැවින් එය ඉදිකළ හොත් ප්‍රවාහන වියදම් අඩු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කටියාව පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ පැරණි ගොඩනැගිල්ල වටා කොන්ක්‍රීට් කණු ඉදිකර පැරණි වහලයට උඩින් ඇස්බැස්ටෝස් වහලයක් ඉදිකර තිබූ නමුත් ඉතා අබලන් තත්ත්වයේ පවතින පැරණි වහලය ඉවත් නොකිරීම නිසා පෙර පාසල් ළමුන් හා ගුරුවරු අනාරක්ෂිත වී තිබුණි. | පෙර පාසල් ළමුන් සහ ගුරුවරුන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කළ යුතු වේ. | මෙහි දෙවන කොටස සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මුදල් නොලැබීම මත කාර්ය අවසන් කිරීමට නොහැකි විය. |

3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂ 02 සිට 05 දක්වා කාලයක සිට ස්ථාන මාරුවී ගොස් තිබුණු, සේවය හැර ගිය සහ වැඩ තහනමට භාජනය වී තිබුණු නිලධාරීන් 32 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.980,845 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. | අයවිය යුතු සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.206,049,855 ක් වූ ජංගම නොවන වත්කම්, සභාව විසින් පත්කර තිබුණු කමිටුවක් මගින් රු.286,567,906 ක වටිනාකමකට ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර තිබුණි. මේ අනුව ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම සියයට 335 කින් වැඩිවී තිබුණු අතර වත්කම් වර්ග 03 ක වටිනාකම් සියයට 23 සියයට 94 දක්වා අඩු වී තිබුණි. | සුදුසුකම්ලත් විශේෂඥ කමිටුවක් මගින් තක්සේරු කර ප්‍රත්‍යාගණනය කළ යුතුවේ. | පිළිගනිමි |

3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 12 ක අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණු අතර වාහන 21 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ද වාහන 04 ක් සඳහා රක්ෂණ ආවරණද ලබාගෙන නොතිබුණි | වාහනවල අයිතිය පවරාගෙන ආදායම් බලපත්‍ර හා රක්ෂණාවරණය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී ආදායම් බලපත්‍ර හා රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කරමි. වාහන 04 ක් සඳහා ලියාපදිංචි කිරීම නොමැති බැවින් රක්ෂණය කර නොතිබුණි. |

3.5.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | | | |
| --- | --- | --- | --- |
| (අ) | වටිනාකම රු.17,615,000 ක් වූ මෝටර් වාහන 08 ක් නිශ්කාර්යව පැවැතුණි. | නිශ්කාර්යය පවතින වාහන සභාවේ ප්‍රයෝජනය සඳහා දායක කර ගත යුතුවේ. | අළුත්වැඩියා කිරීම වාසිදායක වන වාහන අළුත්වැඩියා කිරීමටත් අනෙක් වාහන අපහරණය කිරීමටත් කටයුතු කරමි. |
| (ආ) | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිකර 2019 ජුනි 27 දින සභාවට භාරදී තිබුණු රු.73,000,000 ක් වටිනා දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහලයේ ඇති කඩ කාමර 08 බදුදී නොතිබුණි. | අදාල කඩකාමර ඵලදායී කටයුත්තකට භාවිතා කිරීමට හෝ ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | ඉහළ මහල මේ වනවිට උප කාර්යාලය සඳහා භාවිතා කරමි. ඉතිරි කඩ කාමර බදුදීමට කටයුතු කරමි. |
| (ඇ) | 2017 වර්ෂයේදී රු.9,500,000 ක් වියදම් කර ඉදිකරන ලද තඹුත්තේගම සතිපොළ ගොඩනැගිලි පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන වල් බිහිවීමට ඉඩහැර තිබුණි | සතිපොල ගොඩනැගිලි භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | සතිපොල එම ස්ථානයට ගෙන යෑමට මා විසින් කටයුතු කළද මහා සභාව සතිපොල පෙර පැවති ස්ථානයේම තැබීමට තීරණය කර ඇත. |
| (ඈ) | සභාව විසින් රු.5,421,890 ක් වැය කරමින් එප්පාවල ප්‍රදේශයේ ඉදිකර තිබුණු ආදාහනාගාරය ඊට අවශ්‍ය උදුන් සවි නොකිරීම නිසා වර්ෂ 02 ක් ඉක්මවූ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | අදාල ව්‍යාපෘති භාවිතා කළහැකි තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී ව්‍යාපෘති සංවර්ධන කටයුතු යටතේ උදුන් ලබාගෙන ආදාහනාගාරයේ වැඩ අවසන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වටිනාකම රු.8,000,000 ක් වූ ශ්‍රවනාගාර ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම නිසා ජරාවාස වී අවට වල්බිහිවී තිබුණි. | නිෂ්කාර්ය වත්කම් භාවිතයට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ප්‍රමාණවත් සේවකයන් නොමැති බැවින් ශ්‍රවනාගාරය වෙන්කර දීම සිදුකරන විට පිරිසිදු කරනු ලබයි. තවද විදුලි පද්ධතිවලට හානි වී ඇති බව පිළිගනිමි. |
| (ඊ) | තලාව නගරයේ ඉදිකර ඇති කඩකාමර 20 කින් සමන්විත දෙමහල් ගොඩනැගිල්ල වසර 03 කට ආසන්න කාලයක සිට වසා දමා තිබීම නිසා භූමිය වල් බිහිවී කඩ කාමර ජරාවාස වී තිබුණි. | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළමු මහලේ එක් කඩ කාමරයක් බදුකරු හැර ඉතිරි කඩ කාමර 19 සඳහා සභා තීරණ කඩ ගැනුම්කරුවන් ඉදිරිපත් වී නැත. |

3.6 හඳුනාගත් පාඩු
----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුරනැගුම කඩ කාමර 20 ක් බදුදීම සඳහා ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් 2017 වසරේ රු.73,255 ක වියදම් දරා පුවත්පත් දැන්වීම් පළකර පසුව අවලංගු කර තිබුණු බැවින් රු.73,255 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි. | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | ටිපර් රථයක තිරිංග පද්ධතියේ දෝෂ සහිත වීමක් රියදුරු විසින් වාර්තා කර තිබියදී ධාවනයේ යෙදවීම නිසා 2019 ජනවාරි 31 දින අනතුරකට භාජනය වීමෙන් රු.933,500 ක අලාභ හානියක් සිදුවී තිබුණි. | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට වගබලා ගනිමි. |
| (ඇ) | වටිනාකම රු.6,390,000 ක් වූ කැබ්රථයක් 2019 අප්‍රේල් 15 දින අනතුරකට භාජනය වී රු.3,400,000 ක තක්සේරුගත අලාභයක් සිදුවී තිබුණි. මෙම අනතුර සම්බන්ධ තොරතුරුවල සාවද්‍ය තත්ත්වය සහ අවභාවිතයන් පදනම්ව රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී තිබුණු බැවින් වාහනය අළුත්වැඩියා නොකරමින් වාහනයේ දේශීය නියෝජිතයාගේ ප්‍රාදේශීය අළුත්වැඩියා මධ්‍යස්ථානයක රඳවා තිබුණි. | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරීක්ෂණ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් අවසන් කර වගකිවයුතු පාර්ශව තහවුරු කර ගත් පසු අධිහාර පැනවීමට කටයුතු කරමි. |

3.7 අංශය අක්‍රමිකතා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2020 ජනවාරි 14 දින මුදල් පරීක්ෂාවේදී අතැති මුදල්වල රු.152,961 ක ඌණතාවයක් අනාවරණය විය. | ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ගෙවීම් ලබන්නාගේ අත්සන ලබාගෙන නොමැති බැවින් මුදල්වල හිඟයක් පෙන්නුම් කලද සත්‍ය වශයෙන් ඒ සඳහා ගෙවීම් කර ඇත. දැනට සරප්ගේ දෛනික ලැබීම් ගෙවීම් ලේඛනයක් පවත්වාගෙන යන අතර එමගින් මෙම දෝෂය මඟහරවා ගැනීමට කටයුතු කරමි. |

3.8 ප්‍රසම්පාදනය

---------------

සැපයීම් හා සේවා

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු වටිනාකම රු.5,760,735 ක් වූ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.2 අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව කොටස් 04 කට වෙන්කර ප්‍රජා පාදක සංවිධාන වෙත ලබාදී තිබුණි. | ව්‍යාපෘති ප්‍රදානය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිකිරීමේ ව්‍යාපෘතිය තරඟකාරී ලංසු කැඳවීම මත සිදුකිරීමේදී දීර්ඝ කාලයක් ගත වන බැවින් හා මෙම ඉදිකිරීම් අලි ගහණ ප්‍රදේශයක සිදුකරන බැවින් ලංසුකරුවන් ඉදිරිපත් නොවේ යැයි සිතා මුළු මුදල කොටස් වලට බෙදා ගොවි සංවිධාන හරහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සිදුකර ගැනීමට කටයුතු කර තිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.9.1 අනුව සුදුසුකම් පරීක්ෂා නොකර කරගහවැව කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රු.4,488,490 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | ව්‍යාපෘති ප්‍රදානය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘති ප්‍රජා පාදක සංවිධානවලට ලබාදීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සංවිධානවල කොන්ත්‍රාත් හැකියාව සනාථ කිරීමේ සහතික ලබාගෙන කරගහවැව කසල ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රු. 4,488,490 ක් වූ කොන්ත්‍රාත් පිරිනමා ඇත. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණනවරයෙකු පත්කර අවශ්‍ය වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු සිදුකර බව දන්වමි. |